සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

**6 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල යටින් ඉරක් ඇඳින ලද පදයට වඩාත් සමාන අර්ථය දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

01 විහඟ ගී නද දසත පැතිරිණි.

(1) මී මැසි (2) වීණා (3) කුරුලු (4) කුකුළු

02 බටහිර අහසින් සූර්යයා සමුගත්තේ ය.

(1) තාරපති (2) සක්දෙවි (3) සුළඟ (4) දිනකර

03 පන්සිය පනස් ජාතක පොත බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථයකි.

(1) ගෘහය (2) පුස්තකය (3) පත්තරය (4) සඟරාව

- **අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල දි ඇති පදයට විරුද්ධ අර්ථය දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

04 විකසිත - (1) පිපුණු (2) මුකුලිත (3) විවෘත (4) ඇරුණු

05 වක්‍ර - (1) රවුම් (2) නැමුණු (3) ඍජු (4) දිගු

06 මිහිරි - (1) ඉමිහිරි (2) සුමිහිරි (3) අමිහිරි (4) පිවිතුරු

- **අංක 07 හා 08 ප්‍රශ්නවල පිල්ලම් පිළිවෙළට නිවැරදිව යොදා ඇති වචනයට යටින් ඉරක් අඳින්න.**

07 කොම්බුව සහ ඇලපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල

(1) කොටියා (2) කුඹියා (3) කොච්චි (4) කෝදුරු

08 කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල

(1) බුලතා (2) බුලත් (3) බුරුසු (4) බුරුම

- **අංක 09 හා 10 ප්‍රශ්නවල දි ඇති වචනය නිර්මාණය වීමට ස්වර ව්‍යඤ්ජන නිවැරදි ව ගැළපී ඇති පිළිතුර යටින් ඉරක් අඳින්න.**

09 කෲමියා (1) ක් + සෲ + මි + ඉ + ය් + අ (2) ක් + සෲ + මි + ඊ + ය් + ආ

(3) ක් + ඖ + මි + ඉ + ය් + අ (4) ක් + සෲ + මි + ඉ + ය් + ආ

10 හැන්දැව (1) හ් + ඇ + න් + ද් + ඈ + ව් + අ (2) හ් + ඈ + න් + අ + ද් + ඈ + ව් + අ

(3) හ් + එ + න් + ද් + ඒ + ව් + අ (4) හ් + ඇ + න් + ද් + ඇ + ව් + අ

- **අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි උක්ත පදය තෝරා හිස්තැනෙහි ලියන්න.**

11 ........................................................................................ රෝගීන් සුවපත් කරති.

(1) වෛද්‍යවරයා (2) වෛද්‍යවරයෙක් (3) වෛද්‍යවරුන් (4) වෛද්‍යවරු

12 ........................................................................................ ආහාර පිළියෙල කළාය.

(1) කාන්තාවන් (2) කාන්තාවක (3) කාන්තාවක් (4) කාන්තාවෝ

13 ........................................................................................ පාරට තාර දැමුවේ ය.

(1) කම්කරුවෝ (2) කම්කරුවෙකු (3) කම්කරුවා (4) කම්කරුවන්

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල දී ඇති වාක්‍යයෙහි අනුක්ත පදය තෝරා තිත් ඉරි මත ලියන්න.**

14 දෙමාපියෝ දරුවන් ආරක්ෂා කරති. ........................................................................................

15 ගුරුවරු අප යහමඟ යවති. ........................................................................................

16 කිරිල්ලිය ගැරඬියකු පලවා හැරියා ය. ........................................................................................

- **අංක 17 සිට 20 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදය අයත් පුරුෂය තිත් ඉරිමත ලියන්න.**

17 <u>ඇය</u> දරුවන්ට කෑම කැවුවා ය. ........................................................................................

18 <u>අපි</u> සීගිරි චිත්‍ර නැරඹීමට ගියෙමු. ........................................................................................

19 <u>නුඹ</u> ගමට ගියෙහි. ........................................................................................

20 <u>නැගණිය</u> ගී ගයමින් නටයි. ........................................................................................

(ලකුණු 2 x 20 = 40)

**6 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II කොටස**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 ට නො අඩු රචනයක් ලියන්න.

(අ) හොඳ සිරිත් පුරුදු වෙමු.

(ආ) සුන්දර උදෑසනක්

(ඉ) ඩෙංගු රෝගය පරදවමු.

(ඊ) මගේ අනාගත බලාපොරොත්තුව (ලකුණු 20 යි.)

02 පහත අවස්ථා අතරින් **එකකට** පිළිතුරු සපයන්න.

(අ) රැකියාවෙන් විශ්‍රාම යන ඔබේ පන්ති භාර ගුරුතුමියට යැවීමට සුදුසු සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

<u>නැතහොත්</u>

(ආ) ඔබේ පාසලේ පැවැත්වෙන අධ්‍යාපනික ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන්නැයි ආරාධනා කරමින් දුර බැහැර ප්‍රදේශයක සේවය කරන ඔබේ ලොකු අක්කාට යවන ලිපිය ලියන්න.

(ලකුණු 10 යි.)

03 පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගල් ගුහාව ශුද්ධ කොට අපි අපේ බඩුත් කොට්ට පැදුරුත් එහි තබා ටිකක් හති ඇරියෙමු. අනතුරුව අපි ගල් ගුහාව ළඟ සිට තොටුපළ දක්වා කැලේ කපා අඩි පාරක් තැනුවෙමු. එදින දහවල් ආහාරය වශයෙන් අප කෑවේ කුරුම්බා ය. සවස කජු කඩා පලා මඳ කැවෙමු. රැයෙහි ජින්නා බත් ඉව්වේ ය. මම පොල් ගා සම්බෝලයක් සෑදුවෙමි. බත් කා ගල් තලාවෙහි ඇතුළේ පැදුරු උඩ වැටී නිදන්නට වූ අප අවදි වූයේ පසුදා උදේ කුරුල්ලන්ගේ නාදය ඇසීමෙනි.

(i) ගල් ගුහාව පිරිසිදු කළ පසු ඔවුන් කළේ කුමක් ද?

(ii) කැලේ කපා අඩිපාර සකස් කළේ කොතැනට ද?

(iii) ඔවුන්ගේ දහවල් ආහාරය කුමක් ද?

(iv) රැයෙහි බත් ඉව්වේ කවුද?

(iv) ඔවුන්ව උදෑසන අවදි කළේ කවුද? (ලකුණු 2 x 5 = 10)

04 පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර ගණන කීයද?

(ii) ව්‍යඤ්ජන ශබ්ද හා එකතුව යෙදෙන ස්වර වෙනුවට යෙදෙන සංකේත හඳුන්වන නම කුමක් ද?

(iii) හල් කළ නොහැකි ව්‍යඤ්ජන අක්ෂර 2 ක් ලියන්න.

(iv) පිල්ලමකින් සංකේතවත් නොවෙන ස්වරය කුමක් ද?

(v) ගැටපිල්ල හා ගැටපිලි දෙක සංකේතවත් කරන ස්වර අක්ෂර පිළිවෙළින් ලියන්න.

- පහත වාක්‍යවල හිස්තැනට ගැළපෙන උක්ත පදය හෝ අනුක්ත පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(vi) (ළමයෙක් / ළමයි) ............................................................ බයිසිකලය පදියි.

(vii) (නුඹලා / නුඹ) ..................................................................... පොත කියවෙහි.

(viii) (රජවරු / රජවරුන්) ................................................................... වැව් තැනූහ.

(ix) (මා / මම) ........................................................................... පන්සලට ගියෙමි.

(x) බළලා (මීයෝ / මීයන්) ..................................................................... අල්ලයි.

(ලකුණු 1 x 10 = 10)

05 පහත සඳහන් ප්‍රකාශ කළේ කවුද, කාටද යන්න ලියන්න.

(i) ''මොකද යාළුවා හපන්ට බැරිද?''

(ii) ''හනික, හනික, බලා ඉන්ට කල් නෑ''

(iii) ''ගොහින් බලාපල්ලා මගේ වී ගොඩ''

- පහත කවි දෙක සම්පූර්ණ කරන්න.

(iv) හිස අවුල් කරගෙන
කිළුටු වැරහැලි ඇඳගෙන
පඹයෙකුගෙ විලසින
.....................................................

(v) ඉර උදා වන්නට
පළමු ව නැඟිට සිහිකොට
අලසකම් දුරු කොට
.....................................................

(ලකුණු 2 x 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 3 | (02) | 4 | (03) | 2 | (04) | 2 | (05) | 3 | (06) | 3 | (07) | 1 | (08) | 3 |
| (09) | 4 | (10) | 4 | (11) | 4 | (12) | 3 | (13) | 3 | (14) | දරුවන් | (15) | අප | | |

(16) ගැරඬියකු (17) ප්‍රථම පුරුෂ (18) උත්තම පුරුෂ (19) මධ්‍යම පුරුෂ

(20) ප්‍රථම පුරුෂ

## II කොටස

01. මාතෘකානුකූලව කරුණු ගළපා ලියා ඇති ආකාරය අනුව ලකුණු පිරිනමන්න. පහත ලකුණු ආකෘතිය සැලකිල්ලට ගන්න.

| | |
|---|---|
| මාතෘකාවට අනුව කරුණු සඳහා | ලකුණු 7 යි. |
| සංවිධානාත්මක බව, නිර්මාණශීලී බව සඳහා | ලකුණු 10 යි. |
| ශිල්පීය දක්ෂතා සඳහා | ලකුණු 3 යි. (මුළු ලකුණු 20 යි.) |

02. නිර්මාණාත්මකව නිවැරදි ව සකස් කර ඇති ආකාරය අනුව ලකුණු පිරිනමන්න.

| | |
|---|---|
| ආකෘතිය | ලකුණු 2 යි. |
| කරුණු | ලකුණු 6 යි. |
| ශිල්පීය දක්ෂතා | ලකුණු 2 යි. (මුළු ලකුණු 10 යි.) |

03 (i) බඩු කොට්ට පැදුරු එහි තබා විවේක ගැනීම. (ii) තොටුපළ දක්වා / ගල් ගුහාවේ සිට තොටුපළට

(iii) කුරුම්බා (iv) ජින්නා

(v) කුරුල්ලන් / කුරුලු නාදය (ලකුණු 2 x 5 = 10)

04 (i) 18 කි (ii) පිල්ලම් (iii) ග, ජ, ඬ, ද, ඕ, අං, අඃ, ළ (iv) අ (v) සෘ, සෲ

(vi) ළමයෙක් (vii) නුඹ (viii) රජවරු (ix) මම (x) මීයන්

05 (i) ඉබ්බා නරිනයිදේට / නරියාට (ii) පොරමොලා ගමා හා කයිරාට

(iii) මුවන්තිස්ස කුමාරයා / සහෝදරයින්ට (iv) ඉඳුම හොඳ නෑ බූත කරමින

(v) කරන් වැඩපළ දියුණු වන්නට